පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය - 2015

-------------------------------------------------------------

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ)** **භෞතිකව පවතින බව තහවුරුකර නොගත් රු.67,004 ක තොගයක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.**

**(ආ)** **සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති රු.82,938ක් වටිනා පාරිභෝජන ද්‍රව්‍ය තොගයක වටිනාකම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.**

**(ඇ)** **මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමුච්චිත ලාභයට කරන ලද ගැලපීම් ලෙස දක්වා ඇති රු.16,381,888ක වටිනාකම තුල මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට බලනොපාන එකතුව රු.5,153,507 ක ගැලපීම් අන්තර්ගත කර තිබුණි.**

**2.2.2** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

**සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 115,656 ක ගැලපීම් වලට අදාළ ජර්නල් සටහන් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.**

**2.3** **ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ)** **වසර 05කට වැඩි කාලයක සිට ආයතන 02කින් ලැබිය යුතු එකතුව රු.80,295ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**(ආ)** **වර්ෂ 10කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 265,832 ක් වූ නොගෙවූ වැටුප් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.**

**2.4** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

**පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ---------------------------------------- | ------------------ |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371 (2) | සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 21 කදී ලබා දී තිබූ එකතුව රු. 241,500ක අත්තිකාරම් අදාල කාර්යයන් නිම වී මාස 01 සිට මාස 11 දක්වා ප්‍රමාද වී තිබියදීත් එම අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 507 සහ 756 | ආයතනයේ අංශ 22කින් අංශ 13කට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි අංක 570 සහ 571 | 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අයත් එකතුව රු. 81,500ක ඉකුත් තැන්පත් නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 පරිච්ඡේදය | කොන්ත්‍රාත් ගෙවීම් සමඟ කරනු ලබන එකතු කළ අගය මත බදු මුදල් පිළිබඳ තොරතුරු මාසිකව අදාල ආයතන වෙත දන්වා යවා නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

**2014** සහ **2015** වර්ෂවලට අදාළව රු.**507,589**ක දිරි දීමනා මුදලක් ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ අතර ඒ සඳහා **2014** නොවැම්බර් **21** දිනැති අංක **5/2014** දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ **02** ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2015** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු.**18,403,751**ක ඌනතාවයක් ඇති වී තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.**17,488,936**ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.**914,815** කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඌනතාවය

වැඩිවීම කෙරෙහි සමස්ථ ආදායම රු.13,077,956කින් වැඩිවීම ඉක්මවා ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපාදනය රු.8,745,094 කින් හා වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ රු.14,235,258 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ පැවති ඌනතාවය 2012 වර්ෂයේදී අඩු වුවද 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ක්‍රමයෙන් වැඩිවී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකීමේදී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ දායකත්වය වැඩිවී තිබුණද 2013 වර්ෂයේදී අඩුවී තිබුණි. 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ දායකත්වය වැඩිවීම සියයට 42 කි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

ශ්‍රී ලංකාවේ කල්තබාගත හැකි මෙන්ම කල්තබාගත නොහැකි ආහාර බෝග පිළිබඳව පර්යේෂණ සහ පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදුකිරීම හා කෘෂිකාර්මික නිෂ්පාදනවල සැකසුම් ඇසුරුම්, ප්‍රවාහනය හා ගබඩාකරණය සඳහා අවශ්‍ය නවීන තාක්ෂණය හඳුන්වා දීම තුළින් පසු අස්වනු හානිය අවම කිරීම, ගොවීන්ගේ ආදායම් වැඩිදියුණු කිරීම ආයතනයේ අරමුණ වේ.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 ජූලි සිට 2015 ජූනි දක්වා වර්ෂ 02ක කාල රාමුවක් සහිතව අනුමත කර තිබූ වකුගඩු රෝග ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ආහාර රටා හා ආහාර පිළිබඳ කෙරෙන සමීක්ෂණය 2016 මාර්තු 21 වන විටත් අවසන්කර නොතිබුණු අතර මාස 02 කට වරක් ඉදිරිපත් කළයුතු පර්යේෂණයේ ප්‍රගතිය පිළිබඳ ප්‍රගති වාර්තා 2014 අගෝස්තු මාසයෙන් පසුව ලබාදී නොතිබුණි.

(ආ) 2013 ජූනි මාසයේදී ආරම්භ කර 2014 දෙසැම්බර් මාසයේදී අවසන් වීමට නියමිත සහල් ආශ්‍රිත එක්ස්ට්‍රෑඩඩ් නිෂ්පාදන වැඩිදියුණු කිරීම හා ප්‍රචලිත කිරීම (Development & popularization of rice based Extruded products ) සම්බන්ධ පර්යේෂණය 2016 මැයි 24 වන විටත් අවසන් කර නොතිබුණු අතර, මාස 02කට වරක් ඉදිරිපත් කළයුතු පර්යේෂණ පිළිබඳ ප්‍රගති වාර්තාද ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) විජලනය හා අධිශීත තත්ත්වය යටතේ එළවළු හා පළතුරු සංරක්ෂණය පිළිබඳ පර්යේෂණය ( Promotion of dehydration & freezing industry for fruits & vegetables) සඳහා 2014 වර්ෂයේදී රු. 685,440ක වියදම් දරා අධිශීතකරණයක් මිලදී ගෙන ඇතත් පර්යේෂණයේ අවසන් ප්‍රතිඵලයට අනුව එළවළු හා පළතුරු අධිශීත තත්ත්වයෙන් තබා ගැනීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) පෞද්ගලික අංශ අරමුදල් මත සිදුකරන පර්යේෂණවල ප්‍රතිඵල පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය සහ පෞද්ගලික අංශය අතර බෙදා ගන්නා ක්‍රමවේදය හා එක් පාර්ශවයක් විසින් සිදුකරන ගිවිසුම් කඩ කිරීම් වලදී කටයුතු කල යුතු ආකාරය දෙපාර්ශවය අතර ඇතිකරගෙන තිබූ ගිවිසුම්වල අන්තර්ගත වී නොතිබුණි.

(ඉ) ස්වයංක්‍රීයව පළතුරුවල පොතු ඉවත් කිරීමේ යන්ත්‍රයක් සැලසුම්කර සංවර්ධනය කිරීම (Design & Development an Automated Fruit Peeler) සම්බන්ධ පර්යේෂණය 2015

ජනවාරි සිට **2016** ජුනි දක්වා සිදුකිරීමට උපදේශක කමිටුව අනුමතකර තිබූ අතර, යන්ත්‍රය නිපදවීමට අදාල සියලු සැලසුම් අවසන් කර තිබූ නමුත් ඉදිරි පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් නොසැපයීම හේතුවෙන් පර්යේෂණය **2016** පෙබරවාරි මාසයේදී අතහැර දමා තිබුණි

(ඊ) **2014** වර්ෂයේදී රු.මිලියන **61.6** ක් වියදම් දරා උපකරණ මිලදී ගෙන රසායනාගාරය නවීකරණය කර තිබූ අතර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පර්යේෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය සහතිකය (accreditation) ලබාගෙන නොතිබීම හේතුවෙන් සිදු කරනු ලබන පර්යේෂණ සඳහා පිළිගත හැකි භාවයක් ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(උ) **2015** වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පරික්ෂාවේදී ව්‍යාප්ති අංශය මගින් නිමකල යුතු පුහුණු වැඩසටහන් **280** කින් **117** ක් එනම් සියයට **42** ක් නිමකර නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2** කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් **2009** වර්ෂයේ සිට සිදු කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල ලෙස නව සොයාගැනීම් **05** ක් සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගෙන තිබූ නමුත් එම නව සොයා ගැනීම්වලින් කෘෂිකර්ම හා පසු අස්වනු ක්ෂේත්‍රය ඔස්සේ රටේ ආර්ථිකයට සිදු කර තිබූ දායකත්වය කුමක්ද යන්න සනාථ කිරීමට අවශ්‍ය තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පර්යේෂණවල ප්‍රතිඵල පේටන්ට් බලපත්‍ර ලබාගැනීමට පමණක් සීමා වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස සාර්ථකව නිෂ්පාදනය කර තිබූ එක්ස්ට්‍රෑඩර් වර්ගයේ තෙල් නිෂ්පාදන යන්ත්‍රය විධිමත් අනුමැතියකින් තොරව වෙනත් ආයතනයකට පවරා තිබීම හේතුවෙන් එම යන්ත්‍රයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) පර්යේෂණ මාර්ගෝපදේශ සංග්‍රහයේ **2** ඡේදය ප්‍රකාරව ආයතනය විසින් සිදුකරනු ලබන පර්යේෂණ සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවද, සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂයේ සිදුකරන ලද පර්යේෂණ **11** ක් සඳහා එම අනුමැතිය ලැබී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා **17** කදී නේවාසිකාගාරයේ නවාතැන් ගෙන තිබූ අමුත්තන්ගෙන් අයවිය යුතු රු.**84,600** ක් හා අවස්ථා **09** කදී නවාතැන් ගෙන තිබූ පුද්ගලයින් **09** දෙනෙකුගෙන් නවාතැන් ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ඉ) **2014** වර්ෂයේ දෙසැම්බර් මාසයේදී මිලදීගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට රු.**3,360,000** ක් වටිනා අයිස් ක්‍රීම් යන්ත්‍ර **16** ක් තෝරාගත් ප්‍රතිලාභීන්ට ලබා දී නොතිබුණි.

**4.3** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------------

කෘෂිකර්ම අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ නිලධාරියෙකුගේ ඉල්ලීමක් මත ආයතනය සතු කැබ් රථයක් **2015** මාර්තු **20** වැනි දින සිට එම නිලධාරියා වෙත නිදහස් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ රියදුරු වැටුප් හා දීමනා, ඉන්ධන හා නඩත්තු වියදම් ලෙස එකතුව රු.**870,075** ක් ආයතනයේ අරමුදලින් දරා තිබුණි. තවද, **2015** මාර්තු **20** සිට **2015** අගෝස්තු **01** දක්වා මෙම

වාහනයට අදාලව ලියා තිබූ ධාවන සටහන් වාහනය භාරව ගමන් ගත් නිලධාරියා විසින් අත්සන් කර නොතිබුණු අතර, 2015 අගෝස්තු 07 දිනෙන් පසු ධාවන සටහන් නඩත්තු කර නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රසායනාගාරය නවීකරණය යටතේ මිලදී ගෙන තිබූ රු.44,041,725 ක් වටිනා උපකරණ වලින් රු. 27,311,650 ක උපකරණ පර්යේෂණ සඳහා භාවිතයට ගැනීම සමාලෝචිත වර්ෂය තුල පැය 02 සිට පැය 08 දක්වා ඉතා අවම මට්ටමක පැවති අතර, රු.16,730,075ක් වටිනා යන්ත්‍ර 02ක් සමාලෝචිත වර්ෂය තුල කිසිදු කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) සහල් සැකසුම් පවුල් ස්ථාපිත කිරීම හා සහල් පිටි මෝල් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේදී විදේශාධාර ව්‍යාපෘතියකින් ලැබී තිබුණු රු.110,900 ක් වූ සහල් පිටි ෂිප්ටර් උපකරණ 04 ක් 2016 අගෝස්තු මාසය වන විටද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) නැවුම් එළවළු හා පළතුරු අලෙවි ජංගම වෙළෙඳ කුටි හඳුන්වාදීමේ ව්‍යාපෘතිය යටතේ 2012 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.350,000 ක් වටිනා ජංගම වෙළෙඳ කුටි 07 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි තවදුරටත් විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) පර්යේෂණ පාලනය | ආයතනය විසින් සිදුකරනු ලබන පර්යේෂණ සඳහා පර්යේෂණ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර පර්යේෂණ මාර්ගෝපදේශ යාවත්කාලීන කර නොතිබීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා විධිමත් වැඩ පැවරීමක් තුලින් මානව සම්පත් කළමනාකරණය කිරීම විධිමත් කර නොතිබීම. |
| (ඇ) වත්කම් පාලනය | ආයතනය සතු භෞතික සම්පත් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කර නොතිබීම |